# තේරවිලි

- තේරවිලි කියවා රසවිඳීමටත්,ඒවා විසඳීමටත් බොහෝදෙනා කුඩා කල සිට කැමැත්තක් දක්වති.
- විවේකය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හා විනෝදය ට අතීතයේ දී තේරවිලි භාවිතා කර ඇත.
- ඒවා පරිසරය පිළිබඳ දැනුම මෙන් ම භාෂා දැනුම වර්ධනය කර ගන්නට උදවු වෙයි.
- තේරවිලි වර්ග කිහිපයකි.

1. සරල තේරවිලි
2. තුන් තේරවිලි ( පියවර තුනකදී විසඳා අවසන් පිළිතුර ලබා ගන්නා තේරවිලි ය.)
3. පද පෙරළි
4. තේරවිලි කවි

# 3 ශ්‍රේණිය විෂය නිර්දේශයට අදාළ තේරවිලි

1. තපස් රකිනවා
කෙතේ ඉන්නවා
මාළු සොයනවා
කියන්න මගෙ නම - කොකා

2. උඩහ ගෙදර මම යන කොට
අඟර දඟර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි
නොතේරුවොත් ටොකු විස්සයි - කරවිල

3. ගුලක් බලා රිංගනවා
ඒකෙ ඇතුළෙ කැරකෙනවා
ගේ දොර බඩු රැක දෙනවා
තේරුවොතින් පඩි දෙනවා - යතුර

4. දත් තිබුණත් කටක් නැතේ
සියලු ම දත් උල් ව ඇතේ
අවුල් ලිහා හැඩ කරතේ
නැති ගෙදරක් ඇත්තෙ නැතේ - පනාව

5. පිරිසිදුකම කරන අගේ
ඇවුළ ඉත්තෑ කුරු වගේ
මිදුල වටේ යන එන කොට
රැවුළ ඇඳෙයි පොළොව දිගේ - ඉදල